**<u>ගම්පහ මහා නගර සභාව</u>**

**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් හා වියදම් ගිණුමේ රු.24,915,436 ක අතිරික්තය,ජ'නල් සටහන් 55 මගින් අතිරික්ත/ඌනතා ගිණුමට ගැලපීමේදී රු.25,267,388 ක් ලෙස ලෙජර ගිණුමට ගැලපීම හේතුවෙන් අතිරික්ත හා ඌනතා ගිණුමේ ශේෂය රු.351,952 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම, ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක වීම සහ වත්කම් ණය ගිණුම්වල එකතුව රු.236,519,293 ක් වූ අතර ස්ථාවර වත්කම්හි වටිනාකම රු.240,505,250 ක් වූයෙන් ගිණුම් අතර රු.3,985,957 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් ගිණුම්කරණ අඩුපාඩු යටතේ කලින් ගෙවූ සැපයුම් ණය හිමි රු.316,729 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ගබඩා ණයහිමි (හර) ශේෂයක් ලෙස පෙර ගෙවුම් යටතේ පෙන්වා නොතිබීම නිවැරදි කර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයේ හා ඊට පෙර සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ වාහන 06 ක වටිනාකම එම ආයතනවලින් ලබා ගෙන හෝ තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>**

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.7,216,259 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.35,243,249 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.41,080,544 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

(අ) 2008 වර්ෂයේ ලැබී අගරු වී ඇති චෙක්පත් දෙකක වටිනාකම වූ රු.4,527 ක් 2015 දෙසැම්බර් 31 වන විටත් පෙර ගෙවුම් ගිණුමේ පැවති අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ණය වාරික ගෙවීම සඳහා 2015 ජූනි 11 දින නිකුත් කළ රු.172,375ක් වටිනා චෙක්පත අස්ථානගතවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 392 (අ) II හා III ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් හා බදු | 53,521 | 49,079 | 36,442 |
| ව්‍යාපාර බදු | 3,196 | 3,065 | 1,097 |
| වෙළඳ බලපත්‍ර | 2,035 | 2,018 | 276 |
| වෙනත් ආදායම් | 316,471 | 310,579 | 170,276 |

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ශේෂය සමඟ සැසඳීමේදී වර්ෂය අවසානයේ හිඟ ශේෂය සියයට පහක් වැඩිවී තිබූ අතර, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

#### 2.3.2 වරිපනම් හා බදු

(අ) යක්කල උප කාර්යාල බල ප්‍රදේශය තුළ 2006 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ආ) නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති කාල විශ්ලේෂණය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට රු.21,990,184 ක හිඟ වරිපනම් ශේෂය තුළ අවුරුදු 1 ත් 3 ත් අතර රු.5,978,332 ක ශේෂයක්ද, අවුරුදු 3 ත් 5 ත් අතර රු.3,719,430 ක ශේෂයක්ද, අවුරුදු 5 ට වැඩි රු.1,724,961 ක ශේෂයක්ද විය.

2.3.3 <u>ව්‍යාපාර බදු</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,100,588 ක් වූ හිඟ ව්‍යාපාර බදු ශේෂය තුළ ව්‍යාපාර 230 කින් අයවීමට ඇති වසර 5 ඉක්ම වූ ශේෂය රු.221,350 ක් ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.135,000 ක් ද, වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.58,200 ක් ද විය.

2.3.4 <u>කඩකුලී</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර බදු ගැනුම්කරුට කඩ කාමර පැවරීම, උකස් කිරීම, අතුරු බදුදීම හෝ වෙනත් කිසිවකු හවුල් කරගෙන ව්‍යාපාර පවත්වාගෙන යාම තහනම් වුවද, එම කොන්දේසියට පටහැනිව කඩ කාමර වැඩි ප්‍රමාණයක් බදු ගැනුම්කරුවන් විසින් වෙනත් අයවලුන්ට අතුරු බදු දී තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) පොදු වෙළඳ පොළ ගොඩනැගිල්ලේ කඩ කාමර ලබා ගත් ව්‍යාපාරිකයින් විසින් කඩ කාමර 15 ක් 2008 මැයි 29 සිට වසාදමා තිබුණි. මෙසේ වසා තිබූ බදු ගැණුම්කරුවන්ට එරෙහිව සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක සහ ආදායම් පරිපාලක විසින් සභාව වෙත වාර්තා කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඇ) 2008 අගෝස්තු 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය තුළ නගර සංවර්ධන ව්‍යාපෘතියේ වෙළඳසැල් 51 කින් අයවියයුතු හිඟ ශේෂය රු.8,566,200 ක් විය.

**2.3.5** <u>මාළු වෙළඳසැල්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2011 අගෝස්තු 08 දින මහා සභා තීරණයකට අනුව සිල්ලර හා තොග වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 ක් 2016 මාර්තු 18 දින වනවිටත් කඩ හිමියන් වෙත පවරා දී නොතිබුණි.

(ii) මෙම මාළු වෙළඳසැල් 10 න් මාළු වෙළඳසැල් හතක් නිශ්කාර්යව පැවතුණු අතර, කුලියට දී ඇති කඩ කාමර වලින්ද අදාළ කුලී මුදල් අයකර ගෙන නොතිබුණි.

(iii) මාළු වෙළඳාම සඳහා නගර සභාවෙන් බලපත්‍ර ලත් ස්ථිර කඩ කාමර හිමි ව්‍යාපාරිකයන් සිටියදී පදික වේදිකාවේ මාළු වෙළඳසැල් 05 ක් මගින් මාළු අලෙවිය සිදුකර ගෙන යනු ලබන අතර, දෛනික ගාස්තුවක් හෝ අයකර නොතිබුණි.මේ නිසා වෙළඳසැල් හිමි ව්‍යාපාරිකයින්ට වෙළඳාම අඩුවීම, පාරිභෝගිකයන්ට සෞඛ්‍යාරක්ෂිත නොවන ලෙස මාළු මිලදී ගැනීමට සිදුවීම පරිසර දූෂණය, විථිවල තදබදය වැඩිවීම ආදී ගැටළු මතුවී ඇතත් එම තත්ත්වය පාලනය සඳහා නිසි පියවර ගැනීමක් සිදුකර නොතිබුණි.

( iv) තොග හා සිල්ලර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර, මාළු වෙළඳසැල් හිමියන් 10 දෙනෙකුට ලබා දීමට 2011 අගෝස්තු 08 දින මහා සභාවේදී සභා සම්මත කරගෙන තිබූ අතර මේ දක්වා නීත්‍යානුකූලව ගිවිසුම්ගතකර මාළු වෙළඳසැල් 09 ක් පුද්ගලයන් වෙත ලබාදී නොතිබුණු අතර,පොදු වෙළඳ පොළ සංකීර්ණය අංක 31 දරන මාළු වෙළඳසැල පමණක් 2012 අප්‍රේල් 01 දින ගිවිසුම් අත්සන් කර බදු දී තිබුණි.

( v) 2012 වර්ෂයේ සිට අංක 31,36,37 යන මාළු වෙළඳසැල් 03 ක හිඟ බදු කුලී ශේෂය රු.503,625 ක් විය.

(vi) මාළු වෙළඳ පොළ ඒ සහ බී කොටස්වල ඉවත් කරන ලද වෙළඳසැල් 20 කින් අයවීමට ඇති මුදල පිළිවෙළින් රු.215,000 ක් හා රු.100,100 ක් විය.

2.3.6 <u>වෙළඳ බලපත්‍ර</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.277,375 ක් වූ වෙළඳ බලපත්‍ර ශේෂය තුළ ව්‍යාපාර 64 කින් අයවීමට ඇති රු.105,985 ක් 2003 වර්ෂයේ සිට පැවත එනු ලබන ශේෂයක් විය.

2.3.7 <u>වෙනත් ආදායම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලකවරයෙකු සිටියදී මහා නගර සභාවට විශාල ආදායමක් ලබාගත හැකිව තිබූ දුරකථන කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණු අතර, කුළුණු සම්බන්ධයෙන් ලැබියයුතු ආදායම් සභාවට අහිමි වී ගොස් තිබුණි. දුරකථන කුළුණු 3 කින් පමණක් රු.919,657 ක ගාස්තුවක් අයකර ගෙන තිබුණි.

(ආ) 1989 ජනවාර 20 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ IV(ආ)කොටසෙහි සඳහන් සම්මත ගිනි නිවීම් සේවා අතුරු ව්‍යවස්ථාවේ II වන කොටස ප්‍රකාර අන්තරාදායි හා පීඩාකාරි බලපත්‍ර යටතට වැටෙන ව්‍යාපාර සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍රයට අමතරව ගිනි සහතිකයක් ඇතුළත් කිරීමටත් අවදානම් තත්ත්වය හා සපයන සේවාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් උපරිමය රු.5,000 කට යටත් අමතර ගාස්තුවක් අයකිරීම සුදුසු බවට නිර්දේශ කර තිබූ නමුත් එවැනි ව්‍යාපාර 116 කින් එකතුව රු.232,420 ක් වූ ගාස්තු අයකර ගිනි සහතික ලබාදී නොතිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

අංක රහිත අබලි ට්‍රේලර් 3 ක් හා පොත් අගය රු.203,600 ක් වූ කුබෝටා අත් ට්‍රැක්ටර් 2 ක් වසර 8 කට වැඩි කාලයක සිට භාවිතයට ගැනීමට හෝ අළුත්වැඩියා කිරීමට නොහැකිව පැවති අතර 2015 භාණ්ඩ සමීක්ෂණය මගින් ඒවා වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණද, 2016 මැයි 28 දින වන විටත් එම කටයුතු සිදුකර නොතිබුණි.

3.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මහා නගර සභාව වෙත විවිධ ව්‍යාපෘති යටතේ රු.119,922,003 ක ප්‍රතිපාදන මුදලක් ලැබී තිබූ අතර ව්‍යාපෘති 341 ක් එයින් ඉටු කළ යුතු විය. එම දිනට ව්‍යාපෘති 187 ක් නිම කර තිබූ අතර ව්‍යාපෘති 06 ක් අවලංගු කර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලද ව්‍යාපෘති 87 න් ව්‍යාපෘති 16 ක ඇස්තමේන්තු සකස් කර තිබූ අතර, ඉන් හතරක් සඳහා පමණක් ගිවිසුම්ගතව තිබුණි. රු.667,929 ක් වටිනා මාර්ග හතරක් වෙනුවෙන් සංවර්ධන කටයුතු සඳහා 2015 මැයි මස ගිවිසුම්ගත වී මාස 07 ක් ගතවී ඇතත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.

(ආ) සභා අරමුදල් ව්‍යාපෘති යටතේ ප්‍රතිපාදිත ව්‍යාපෘති 211 න් ව්‍යාපෘති 100 ක ඇස්තමේන්තු සකස්කර තිබුණු අතර,අයවැය ප්‍රතිපාදන සීමාවීම හේතුවෙන් ගිවිසුම්ගතවී තිබුණේ ව්‍යාපෘති 25 ක් සඳහා පමණි.

3.3 **යක්කල සතිපොළ ඉදිකිරීම**

යක්කල සති පොළ ඉදිකිරීම සඳහා 2002 අප්‍රේල් 04 දින සිට බැංකු ස්ථාවර නියෝග මත ගෙවීම් කිරීමේ පදනම මත රු.4,855,000 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලැබී තිබුණි. 2014 වර්ෂයේ එම ණයමුදල් යොදවා ඉදිකර තිබූ සති පොලේ ගොඩනැගිල්ල ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මුළුමනින්ම කඩා ඉවත්කර වෙනත් සැලැස්මක් යටතේ ඉදිකිරීම් සිදුකර මහ නගර සභාවට පවරා දී තිබුණි. කෙසේ වෙතත් 2015 දෙසැම්බර් 31 දින දක්වා මෙම ණය මුදල වෙනුවෙන් සභාව විසින් වාරික වශයෙන් රු.4,855,000 ක්ද, පොලී වශයෙන් රු.1,949,145 ක්ද ගෙවා තිබුණි. මෙම ණය මුදල හා පොලී මුදල් වෙනුවෙන් රු.6,804,145 ක පිරිවැයක් දරා ඉදිකරන ලද ගොඩනැගිලි කඩා ඉවත් කිරීමෙන් එම මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.4 **මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා**.

2002 පෙබරවාරි 15 දින ගැසට් නිවේදනයක් මගින් ගම්පහ මහ නගර සභාව සතු පාරවල් ගැසට් කර මාර්ග ලේඛනයේ ඇතුළත් කර යාවත්කාලීන කලයුතු වුවද, 2015 දෙසැම්බර් 31 දිනය වන විටත් මාර්ග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 විගණිත දින වන විටත් මාර්ග ලේඛනයේ මාර්ග 1646 ක් පමණක් සටහන් කර තිබුණි. පසුගිය වර්ෂ 3 ක පමණ කාලයක සිට නිමකර තිබූ මාර්ග මෙම ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

3.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

2015 ජූලි 13 දිනැති මන්ත්‍රී කමිටු තීරණ දැනුම් දීම අනුව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ තාක්ෂණික දැනුම හා උපදෙස් මත ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරීමටත් ඒ සඳහා සුදුසු ඉඩමක් මිලදීගෙන අදාළ ඇස්තමේන්තු සකස් කිරීම සුදුසු බවටත්, කසළ අවසන් බැහැර ලීම සඳහාද ඉඩමක් මිලට ගෙන එහි දහන තාපකයක් ස්ථාපිත කිරීම සුදුසු බවටත් නිර්දේශ කර තිබුණද, 2016 මැයි 28 දින වන විටත් ඒ සඳහා සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. කසල බැහැර කිරීම සඳහා සමාලෝචිත වසර තුල රු.11,388,100 ක් නගර සභාව වැයකර තිබුණි.

3.6 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

2008 දෙසැම්බර් 22 දින යක්කල කිරිදිවැල මාර්ගයට යාබදව කඩකාමර 102 කින් සමන්විත සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් සමග රු.122,655,339 ක ගිවිසුමකට එළඹී ( ගිවිසුම් කාලය මාස 9 ක්) වසර හතක් ගතවී තිබුණි. 2009 අප්‍රේල් 09 දින සිට 2015 අප්‍රේල් 07 දින දක්වා අවස්ථා දහයකදී රු. මිලියන 66.3 ක මුදලක් කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවීම් කර තිබුණු අතර, විගණිත දිනයවූ 2016 පෙබරවාරි 16 දින වන විට සාප්පු සංකීර්ණයේ කඩ කාමර 41 ක කටයුතු නිමවී ඇතත්, මෙම ව්‍යාපෘතියෙන් මෙතෙක් කිසිදු ප්‍රතිලාභයක් අත්කර ගෙන නොතිබුණි.

## 4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු  කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) ආදායම් පරිපාලනය
(ඊ) කොන්ත්‍රාත් පාලනය
(උ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
(ඌ) තොග පාලනය